අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය 'ඉසුරුපාය', බත්තරමුල්ල, ශ්‍රී ලංකාව.
கல்வி, உயர் கல்வி மற்றும் தொழிற் கல்வி அமைச்சு 'இசுருபாய', பத்தரமுல்ல, இலங்கை.
Ministry of Education, Higher Education and Vocational Education 'Isurupaya', Battaramulla, Sri Lanka.
+94112785141-50 +94112785818
info@moe.gov.lk www.moe.gov.lk

මගේ යොමුව / எனது இல. / My Ref. ED/12/01/01/පොදු

ඔබේ යොමුව / உமது இல. / Your Ref.

දිනය / திகதி / Date 2026.05.20

චක්‍රලේඛ අංක:- 44/2025

සියලු ම පළාත් ප්‍රධාන ලේකම්වරුන්,

සියලු ම පළාත් අධ්‍යාපන ලේකම්වරුන්,

සියලු ම පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්,

සියලු ම කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්,

සියලු ම ජාතික පාසල් විදුහල්පතිවරුන්,

සියලු ම ජාතික අධ්‍යාපන විද්‍යාපීඨ පීඨාධිපතිවරුන්,

සියලු ම ගුරු විද්‍යාලවල විදුහල්පතිවරුන්,

සියලු ම ගුරු සංවර්ධන මධ්‍යස්ථාන කළමනාකරුවන්,

**<u>අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශයට අයත් ජාතික පාසල්, ජාතික අධ්‍යාපන විද්‍යාපීඨ, ගුරු විද්‍යාල හා ගුරු සංවර්ධන මධ්‍යස්ථානවල සේවයේ නියුතු අනධ්‍යයන කාර්ය මණ්ඩලයේ රාජකාරි වේලාව</u>**

1. අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශයට අයත් ජාතික පාසල්, ජාතික අධ්‍යාපන විද්‍යාපීඨ, ගුරු විද්‍යාල හා ගුරු සංවර්ධන මධ්‍යස්ථානවල සේවයේ නියුතු අනධ්‍යයන කාර්යය මණ්ඩලවල රාජකාරි වේලාවන් පිළිබඳව රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 9/2006, 27/2013, 08/2014 සහ 29/2017 හි විධිවිධානවලට අනුකූලව මෙම චක්‍රලේඛය නිකුත් කරනු ලැබේ.

2. රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 09/2006 අනුව, පහත සඳහන් ද්විතීයික මට්ටමට අයත් අනධ්‍යයන කාර්යය මණ්ඩලය දිනකට පැය 7යි විනාඩි 45ක් සේවයේ යෙදිය යුතුයි.
   i. සංවර්ධන නිලධාරි සේවයට අයත් නිලධරයන්
   ii. ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සේවයට අයත් නිලධරයන්
   iii. ශ්‍රී ලංකා පුස්තකාලයාධිපති සේවයට අයත් නිලධරයන්
   iv. කළමනාකරණ සේවා නිලධාරි සේවයට අයත් නිලධරයන්
   v. ආශ්‍රිත නිලධාරීන් (සංවර්ධන සහකාර/ සැලසුම් හා මූල්‍ය සහකාර/ කළමනාකරණ සහකාර සේවාවන්ට අයත් නිලධරයන්)
   vi. කළමනාකරණ සහකාර (තාක්ෂණික නොවන) (ඛණ්ඩ II) සේවක ගණයට අයත් නිලධරයන් (ලේඛන සහකාර, රසායනාගාර සහකාර, තාක්ෂණ පීඨ සහකාර)

3. එමෙන්ම , පහත සඳහන් කණිෂ්ඨ කාර්ය මණ්ඩල දිනකට පැය 08කුත් මිනිත්තු 45ක් සේවයේ යෙදිය යුතුය.
   i. කාර්යාල කාර්ය සහායක සේවයේ තනතුරුධාරීන්
   ii. ප්‍රාථමික ශිල්පීය නොවන සේවක ගණයේ තනතුරුධාරීන් (කාර්යය සහායක, සේවා සහායක - සනීපාරක්ෂක, රසායනාගාර සහායක, තාක්ෂණික පීඨ සහායක, පුස්තකාල සහායක, පාසල් ආරක්ෂක)

4. ඒ අනුව ශිෂ්‍ය ශිෂ්‍යාවන්ගේ අධ්‍යයන කටයුතුවලට ඉවහල් වන ලෙස මෙම වේලාවන් සකස් කොට ඇති අතර, තනතුරු අනුව රාජකාරි වේලාවන් පහත පරිදි වේ.

**අනධ්‍යයන කාර්යය මණ්ඩලයේ රාජකාරි වේලාවන්**

| තනතුර හා සේවා ස්ථානය | | සාමාන්‍ය රාජකාරි වේලාව | සාමාන්‍ය දෛනික රාජකාරි පැය ගණන (දිවා ආහාරය සඳහා පැය ½ කාලය ද ඇතුළත්ව) |
|---|---|---|---|
| සංවර්ධන නිලධාරි, තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සහකාර , කළමනාකරණ සේවා නිලධාරි හා ආශ්‍රිත නිලධාරීන් | ජාතික පාසල් | පෙ.ව. 7.30- ප.ව 3.15 | පැය 7 මිනිත්තු 45 |
| | ජාතික අධ්‍යාපන විද්‍යාපීඨ | පෙ.ව. 8.30 - ප.ව. 4.15 | |
| | ගුරු විද්‍යාල | පෙ.ව. 8.30 - ප.ව. 4.15 | |
| | ගුරු සංවර්ධන මධ්‍යස්ථාන | පෙ.ව. 8.30 - ප.ව. 4.15 | |
| රජයේ පුස්තකාලයාධිපති | ජාතික පාසල් | පෙ.ව. 7.30 - ප.ව. 3.15 | පැය 7 මිනිත්තු 45 |
| | ජාතික අධ්‍යාපන විද්‍යාපීඨ | පෙ.ව. 8.00 - ප.ව. 3.45 | |
| | ගුරු විද්‍යාල | පෙ.ව. 8.00 - ප.ව. 3.45 | |
| රියදුරු | ජාතික පාසල් | පෙ.ව 7.00 - ප.ව. 4.00 | සෙනසුරාදා දින ද සේවයේ යොදවා ගන්නේ නම් සතියට පැය හතලිස් පහක් (45)ක් ආවරණය වන පරිදි, දිනකට පැය හතහමාර (7 ½)ක් වන සේ දෛනික රාජකාරි කාලය සකස් කර ගත යුතුය. ඒ අනුව රා.ප.ච. 27/2013 මඟින් නිකුත් කරන ලද නියෝග පරිදි සේවයේ යොදවා ගැනීම සඳහා විදුහල්පති විසින් රාජකාරි වැඩ පිළිවෙලක් සකස් කළ යුතුය. |
| | ජාතික අධ්‍යාපන විද්‍යාපීඨ | | |
| | ගුරු විද්‍යාල | | |
| | ගුරු සංවර්ධන මධ්‍යස්ථාන | | |
| කාර්යාල කාර්යය සහායක | ජාතික අධ්‍යාපන විද්‍යාපීඨ | පෙ.ව. 8.00 - ප.ව. 4.45 | පැය 8 මිනිත්තු 45 |
| | ගුරු විද්‍යාල | පෙ.ව. 7.45 - ප.ව. 4.30 | |
| ලේඛන සහකාර | ජාතික පාසල් | පෙ.ව. 7.30 - ප.ව. 3.15 | පැය 7 මිනිත්තු 45 |
| | ජාතික අධ්‍යාපන විද්‍යාපීඨ | පෙ.ව. 8.30 - ප.ව. 4.15 | |
| රසායනාගාර සහකාර | ජාතික පාසල් | පෙ.ව. 7.15 - ප.ව. 3.00 | පැය 7 මිනිත්තු 45 |
| | ජාතික අධ්‍යාපන විද්‍යාපීඨ | පෙ.ව. 7.45 - ප.ව. 3.30 | |

| | | | |
|---|---|---|---|
| තාක්ෂණ පීඨ සහකාර | ජාතික පාසල් | පෙ.ව. 7.15 - ප.ව. 3.00 | පැය 7 මිනිත්තු 45 |
| | ජාතික අධ්‍යාපන විද්‍යාපීඨ | පෙ.ව. 8.30 - ප.ව. 4.15 | |
| රසායනාගාර සහායක හා තාක්ෂණ පීඨ සහායක | ජාතික පාසල් | පෙ.ව. 7.00 - ප.ව. 3.45 | පැය 8 මිනිත්තු 45 |
| | ජාතික අධ්‍යාපන විද්‍යාපීඨ | පෙ.ව. 7.30 - ප.ව. 4.15 | |
| පුස්තකාල සහායක | ජාතික පාසල් | පෙ.ව. 7.00 - ප.ව. 3.45 | පැය 8 මිනිත්තු 45 |
| | ජාතික අධ්‍යාපන විද්‍යාපීඨ | පෙ.ව. 8.00 - ප.ව. 4.45 | |
| | ගුරු විද්‍යාල | පෙ.ව. 7.45 - ප.ව. 4.30 | |
| පාසල් ආරක්ෂක | ජාතික පාසල් | පැය 9 | පැය 9ක් පූර්ණ කාලීන සේවයේ යෙදිය යුතු අතර ඒ සඳහා ආයතන ප්‍රධානි විසින් රාජකාරි වැඩ පිළිවෙලක් සකස් කළ යුතුය. |
| | ජාතික අධ්‍යාපන විද්‍යාපීඨ | පැය 9 | |
| සේවා සහායක - සනීපාරක්ෂක සහ කාර්යය සහායක | ජාතික පාසල් | පෙ.ව. 7.00 - ප.ව. 3.45 | පැය 8 මිනිත්තු 45 |
| | ජාතික අධ්‍යාපන විද්‍යාපීඨ | පෙ.ව. 8.00 - ප.ව. 4.45 | |
| | ගුරු විද්‍යාල | පෙ.ව. 8.00 - ප.ව. 4.45 | |
| අරක්කැමි | ජාතික පාසල් | පැය 08 විනාඩි 45 | පැය 08 මිනිත්තු 45ක් පූර්ණ කාලීන සේවයේ යෙදිය යුතු අතර ඒ සඳහා ආයතන ප්‍රධානි විසින් රාජකාරි වැඩ පිළිවෙලක් සකස් කළ යුතුය. |
| | ජාතික අධ්‍යාපන විද්‍යාපීඨ | | |
| | ගුරු විද්‍යාල | | |

5. මෙම චක්‍රලේඛයේ 04 ඡේදය යටතේ සඳහන් නොවන ශිෂ්‍ය නිවාස අධිකාරි/සහකාර ශිෂ්‍ය නිවාස අධිකාරි/ගිලන්හල් සේවක යන නේවාසිකාගාර කාර්ය මණ්ඩලය සඳහා දැනට සේවා අවශ්‍යතාවය මත ක්‍රියාත්මක කරනු ලබන විධිවිධාන එලෙසම පවත්වාගත යුතුය.

6. මෙම චක්‍රලේඛය 2026.06.01 දින සිට ක්‍රියාත්මක වේ.

7. තවද රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 9/2006, 27/2013, 08/2014 සහ 29/2017 මගින් ලබා දී ඇති විධිවිධාන තවදුරටත් නොවෙනස්ව පවතී.

නාලක කලුවැව
ලේකම්